| | |
|---|---|
| | **මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය** |
| | දෙවන වාර පරීක්ෂණය - 2023 |
| 11 **ශ්‍රේණිය** | **බුද්ධ ධර්මය - I** |

නම/ විභාග අංකයඃ ……………………………………. කාලය පැය 1 යි

★ **01 - 40 තෙක් ඇති සියලුම ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර තෝරන්න.**

01) පරාජය තුළ ම ජයග්‍රහණයේ මාවත වැටී ඇති බව තරයේ සිහි තබා ගත යුතු බව බුදු දහමින් අවධාරණය කරනු ලබන්නේ
1) සිහි මුළා නොවී කටයුතු කළ යුතු බවය.
2) ආරම්භයේ සිට නොපසුබට වීර්යයෙන් කටයුතු කළ යුතු බව ය.
3) සත්‍යය වෙනුවෙන් පෙනී සිටිය යුතු බවය.
4) කලහකාරී නොවී සමගියෙන් වාසය කළ යුතු බවය.

02) "අරඹව් නික්මෙව්, යෙදෙව් බුදු සසුන්හි දිනව්. මරසෙන් පරද බට කැලයට වැදි ඇතෙකු සේ" යන අදහස අරුණාවතී සූත්‍රයේ ඇතුළත් පාළි පාඨයේ මුල් පදය වන්නේ
1) "අක්කොච්ඡි මං අවධි මං ……"
2) "අචරික්වා බ්‍රහ්ම චරියං ….."
3) "අරභථ නික්ඛමථ යුඤ්ජථ බුද්ධ සාසනේ …."
4) "අනේක ජාති සංසාරං ……"

03) සමාජයට බරක් නොවන ආකාරයට ප්‍රත්‍ය පහසුකම් ලබා ගනිමින් දයකයා මිත්‍යාවෙන් මුදවා සත්‍ය කරා යොමු කිරීමේ සමාජ නායකත්වය හිමිවන්නේ
1) ගුරුවරයාට ය
2) රාජ්‍ය නායකයාට ය
3) දෙමව්පියන්ට ය
4) භික්ෂූන් වහන්සේ ටය

04)
තුන් ලොව තතු ලෙසට
දැනගෙන නොදත් මෙලොවට
දෙසූයෙන් නියම කොට
……….. යැයි කියති මුණිඳුට

1) අරහං
2) ලෝකවිදූ
3) සුගත
4) සම්මා සම්බුද්ධ

05) තමාගේ වෙනත් කටයුතු පසෙකින් තබා සිතට නගා ගැනීමට සුදුසු බැවින් ධර්මය
1) සන්දිට්ඨික නම් වේ
2) අකාලික නම් වේ
3) ඕපනායක නම් වේ
4) ඒහිපස්සිකෝ නම් වේ

06) පිරිත් පින්කමකදී මහ පිරිත් දේශනාවෙන් ආරම්භ කර ආටානාටිය සූත්‍රය හා සෙත් පිරිත් දේශනා කර පිරිත අවසන් වේ. මෙහි මහ පිරිතට අයත් සූත්‍ර ඇති වරණය තෝරන්න.
a) මංගල සූත්‍රය
b) ධජග්ග සූත්‍රය
c) රතන සූත්‍රය
d) පරාභව සූත්‍රය
e) කරණීය මෙත්ත සූත්‍රය

1) A C E
2) A B C
3) C D E
4) B D E

07) ජලයෙහි පාසි ඇත්නම් ඒ තුළ කිසිවක් නොපෙනේ. එමෙන්ම සිතෙහි කයෙහි නිදිමත ගතිය, උදාසීන අලස ගතිය පවතී නම් පාඩම් කළ දෙය මතකයට නොඑයි. මෙම නිදිබර අලස ගතිය හැඳින්වෙන්නේ

1) කාමච්ඡන්දය ලෙසිනි
2) ථීනමිද්ධය ලෙසිනි
3) ව්‍යාපාරය ලෙසිනි
4) විචිකිච්ඡාව ලෙසිනි

08) සියලු කෙලෙස් මුළුමනින්ම නැති කොට ලබන නොබිඳෙන චිත්ත පාරිශුද්ධිය තුළින්ම ඇති තතු ඇති සැටියෙන් දැකීම විදර්ශනා භාවනාවේ දී සිදුවේ. මෙහිදී වර්ධනය වන්නේ

1) ශීලයයි
2) සමාධියයි
3) දානයයි
4) ප්‍රඥාවයි

09) බුද්ධ ශාසනය මෙන්ම බෞද්ධ සමාජය පිරිහී ගිය යුගයක සසුන නගා සිටුවීම් අපේක්ෂා පෙරදැරිව "සිල්වත් සමාගම" පිහිටුවා ගත්තේ

1) පූජ්‍ය වැලිවිට අසරණ සරණ සරණංකර හිමි
2) අනගාරික ධර්මපාල තුමා
3) පූජ්‍ය රේරුකානේ චන්දවිමල හිමි
4) දුටුගැමුණු රජතුමා

10) සටනේ දී මිය ගිය සතුරා ගෞරව සහිතව ආදහනය කොට සෑයක් තනවා නිශ්ශබ්දතාව දක්වා එයට ගරු කරන ලෙස ජනතාවගෙන් ඉල්ලා සිටියේ

1) විජයබාහු රජුය
2) දුටුගැමුණු රජුය
3) ගෝඨාභය රජුය
4) පරාක්‍රමබාහු රජුය

11) වැරදි ජීවනෝපායන්ගෙන් වෙන්වී දැහැමි දිවිපැවැත්මෙන් යුතුව යහපත් ජීවිකාවෙන් යුක්ත වීම හැඳින්වෙන්නේ

1) සුචිකම්ම ලෙසිනි
2) නිස්සම්මකාරී ලෙසිනි
3) ධම්මජීවී ලෙසිනි
4) සතිමතෝ ලෙසිනි

12) සිල්වත් වූ පුද්ගලයා කය වචනය දෙකෙහි සංවරකම නිසා දුසිරිතෙන් වැළකී සුසිරිතේ යෙදෙයි. එනමුත් පවිටු මිතුරු ඇසුර නිසා පුද්ගලයා

1) දුසිරිතම දුරාචාරයට යොමු වේ.
2) ධනය විනාශ වී පිරිහීමට පත් වේ.
3) විශ්වාසය කඩ වී සමාජ අපකීර්තියට පත් වේ.
4) ඉහත සියලු පිළිතුරු නිවැරදි වේ.

13) ඉතා දක්ෂ ලෙස, කඩිසරව, ගෘහ කටයුතු මැනවින් ඉටුකිරීම, ඇසුරු කරන පිරිසට මැනවින් සංග්‍රහ කිරීම හා උපයන ධනය ආරක්ෂා කිරීම යුතුකමක් වන්නේ

1) බිරිය - සැමියට
2) ගිහියා - පැවිදි පක්ෂයට
3) දරුවන් - දෙමාපියන්ට
4) සේවකයා - ස්වාමියාට

14) අවිද්‍යාවෙන් අන්ධ වූ කෙලෙස්වලින් දූෂිත වූ සමාජයේ අනුවණ පුද්ගලයා අඳුරින් අඳුරටම කාමයෙන් කාමයට, වෛරයෙන් වෛරයට ගමන් කරයි. ලෝක ස්වභාවය මෙයයි. එනමුදු බුදුදහම වෛර කරන සමාජයේ ඉවසීම ද, මසුරු සමාජයක දන්දීම ද සොරකම බහුල සමාජයක විශ්වාසවන්තකම ද අගය කරයි. මෙම පිළිවෙත හැඳින්වෙන්නේ

1) අනුසෝතගාමී පිළිවෙත ලෙසිනි
2) පටිසෝතගාමී පිළිවෙත ලෙසිනි
3) අපායගාමී පිළිවෙත ලෙසිනි
4) මැදුම් පිළිවෙත ලෙසිනි

15) මිත්‍යා දෘෂ්ඨිය හෙවත් වැරදි දැකීම එනම් මෝහය

1) කාය කම්මයකි
2) වචී කම්මයකි
3) මනෝ කම්මයකි
4) ජනක කම්මයකි

16) ජීවිත පුරුද්දක් ලෙස කරනු ලබන දන්දීම, සිල් රැකීම, භාවනා කිරීම මෙන්ම, ප්‍රාණඝාතය, සොරකම, මත්ද්‍රව්‍ය භාවිතය ආදී කුසලාකුසල කර්ම ප්‍රතිසන්ධි විපාක දීම සඳහා ඉදිරිපත් විය හැකිය. එම කර්ම හඳුන්වන්නේ

1) ජනක කම්ම ලෙසිනි
2) ආසන්න කම්ම ලෙසිනි
3) ආචිණ්ණ කම්ම ලෙසිනි
4) කමක්කා කර්ම ලෙසිනි

17) බුදු දහමට අනුව හට ගැනීමේ ස්වභාවයෙන් යුක්ත වූ සෑම දෙයක් ම නැතිවීමේ ස්වභාවයෙන් යුක්ත වේ. මේ අනුව මිරිඟුවකට උපමා කොට ඇත්තේ

1) රූපය
2) සංඥාවය
3) සංස්කාර ය
4) වේදනාව ය

18) "ඉමස්ස නිරෝධා ඉදං නිරුජ්ඣති" යන් පටිච්ච සමුප්පාද න්‍යායෙන් පැහැදිලි කෙරෙනුයේ

1) හේතුව ඇති කල්හි ඵලය ඇත යන්නය
2) හේතුව ඉපදීමෙන් ඵලය උපදියි යන්නය
3) හේතුව නැති කල්හි ඵලය නැත යන්නය
4) හේතුව නැති කිරීමෙන් ඵලය නැති කළ හැකිය යන්නය

19) බුද්ධ කාලීන භාරතයේ විමුක්තිය පිණිස අනුගමනය කළ ප්‍රධාන පිළිවෙත් දෙකකි. ඉන් තෘෂ්ණාධිකව ශරීරයට අධික ලෙස සැප දීමේ පිළිවෙත හඳුන්වන්නේ

1) කාම සුඛල්ලිකානුයෝගය ලෙසිනි
2) අත්තකිලමතානුයෝගය ලෙසිනි
3) මධ්‍යම ප්‍රතිපදාව ලෙසිනි
4) අනුසෝතගාමී පටිපදාව ලෙසිනි

20) බුදු සිරිතේ වැදගත් සිදුවීම් රැසක් ස්වභාවික පරිසරය ඇසුරු කරගෙන සිදුවී ඇත. ඒ අනුව ශාක්‍ය කුමාරවරුන්ගේ පැවිදි බව සිදුවූයේ

1) අනුපිය අඹ වනයේ දී ය.
2) මකුල පර්වතයේ දී ය.
3) සූකරකත ලෙනෙහිදී ය.
4) කලන්දක නිවාසයේ දී ය.

21) ව්‍යායාමය කායික නිරෝගී බවට අවශ්‍ය බව බුදුදහම පෙන්වා දෙන්නේ ………………….. හා එහි ආනිසංස දක්වමිනි. හිස්තැනට සුදුසු පදය වන්නේ

1) භාවනාවය
2) ජන ස්නානය
3) නින්ද
4) සක්මන් කිරීම

22) භික්ෂූන් වහන්සේ පමණ දැන ආහාර ගත යුතු බව සියලු බුදුවරුන් දේශනා කර ඇති බව දැක්වෙන්නේ

1) ධම්ම පදයේය
2) ඕවාද ප්‍රාතිමෝක්ෂයේ ය
3) සේඛියාවලය
4) සිරිත් මල්දමෙහි ය

23) වලගම්බා රාජ්‍ය සමයේ ඇති වූ බැමිණිතියාසාය නම් වූ සාගතය මුල් කොට ගෙන ඇති වූ ශාසනික පරිහානිය මුල්කරගෙන ඇති වූ සංගායනාව වනනේ

1) පංචසතිකා සංගීතියයි
2) සාහස්සිතා සංගීතියයි
3) සප්ත සතිකා සංගීතියයි
4) අලුවිහාර සංගීතියයි

24) අනුරාධපුර යුගයට අයත් පැරණිම සිතුවම් දැකිය හැක්කේ

1) සීගිරිය හා හිඳගලය
2) මහනුවර හා කැළණිය
3) තිවංක පිළිම ගෙය ගහා ජේතවනාරාමය
4) මහියංගන ස්තූපය හා දිඹුලාගල

25) අනුරාධපුර යුගයේ ලියැවුණු සාහිත්‍යකරණයට යොමුවන්නට උපදෙස් සපයන දැනට ශේෂව පවතින ග්‍රන්ථයකි.

1) ධම්පියා අටුවා ගැටපදය
2) සිඛවළඳ හා සිඛවළඳ විනිස
3) සියබස්ලකර
4) සීහලට්ඨකථා

26) අඹුදරුවන් ඇතුළු රජ පවුලට රැකවරණය සැලසීම, තිරිසනුන්ට රැකවරණය ලබාදීම, දිළිඳු ජනයාට ධනය දීම, රටේ අධාර්මික ක්‍රියා ඇති නොවන අයුරින් කටයුතු කිරීම යන කරුණු ඇතුළත් වන රාජ්‍ය පාලන මූලධර්මය වන්නේ

1) සතර සංග්‍රහ වස්තුවලය 2) සතර අගතියේය
3) සප්ත අපරිහානිය ධර්මවලය 4) දස සක්විත්වත්වලය

27) දෙමව්පියන් ගුරුවරුන් කියන නිසා කරුණු නොදන පදනමකින් තොරව තෙරුවන් කෙරෙහි ඇතිකර ගනු ලබන ශ්‍රද්ධාව හැඳින්වෙන්නේ

1) අවෙච්ච ප්‍රසාදය ලෙසිනි 2) අචල ශ්‍රද්ධාව ලෙසිනි
3) ආකාරවතී ශ්‍රද්ධාව ලෙසිනි 4) අමූලිකා ශ්‍රද්ධාව ලෙසිනි

28) අප මහා බෝසතාණන් බාහිර වස්තු විනාශ වුව ද, ශරීර අවයව විනාශ වුව ද, ජීවිතය විනාශ වුව ද අත් නොහරින අධිෂ්ඨානයෙන් යුතුව කටයුතු කළ සේක. මෙම පාරමිතාව පිරූ ආකාරය හෙළි වන ජාතක කථාවක් වන්නේ

1) තේමිය ජාතකය 2) වණ්ණුපථ ජාතකය
3) වට්ටක ජාතකය 4) ක්ෂාන්තිවාදී ජාතකය

29) එංගලන්තයේ ලන්ඩන් බෞද්ධ මධ්‍යස්ථානය, කල්කටාවේ ධර්ම රාජික මහා විහාරය, බරණැස මූලගන්ධකුටි මහා විහාරය ඉදිකිරීමට මූලිකත්වය ගනු ලැබුවේ

1) අනගාරික ධර්මපාල තුමා ය. 2) දුටුගැමුණු රජතුමා ය.
3) ඕල්කට් තුමාය. 4) බ්ලැවැට්ස්කි මැතිණිය ය.

30) යමෙකු පව් කළොත් එයින් ඔහුම කෙලෙසෙන්නේ ය. යමෙකු පව් නොකළොත් එයින් ඔහුම පිරිසිදු වන්නේ ය. පිරිසිදුකම හා අපිරිසිදුකම පවතින්නේ තමා කෙරෙහිමය. එක් අයෙකුට තවත් අයෙකු පිරිසිදු කළ නොහැකිය. යන අදහස දෙන ධම්මපද ගාථාවේ මුල් පදය වනුයේ,

1) "අක්කොච්ඡිමං අවධිමං" 2) "අත්තනාව කතං පාපං"
3) "කතං කම්මං කතං සාධු" 4) "තංච කම්මං කතං සාධු"

31) අලාභ, අයස, නින්දව හමුවේ කම්පාවට පත් නොවී, එහි වෙනස්වන සුළු ස්වභාවය වටහා ගෙන එම යථාර්ථය නුවනින් දැකල මැදිහත්ව කටයුතු කිරීමේ හැකියාව ලැබෙන්නේ

1) සමථ භාවනාවෙනි 2) විදර්ශනා භාවනාවෙනි
3) ආනාපානසති භාවනාවෙනි 4) බුද්ධානුස්සති භාවනාවෙනි

32) ශීල ශික්ෂාවට අයත් මාර්ගාංග ඇතුළත් වරණය තෝරන්න.

a) සම්මා දිට්ඨි b) සම්මා වාචා c) සම්මා සංකප්ප
d) සම්මා කම්මන්ත e) සම්මා ආජීව

1) a b c 2) c e f 3) b c e 4) b e f

33) නිතර නිදන සුළු බව, කතාවෙන් ම දවස ගෙවීම, හැකියාව තිබියදීත් මහළු වියට පත් දෙමාපියන්ට නෙසැළකීම, දූ කෙළියෙහි ලොල් බව යනාදී පුද්ගල ජීවිත පරිහානියට හේතුවන කරුණු ඇතුළත් සූත්‍රය වන්නේ

1) මංගල සූත්‍රය 2) පරාභව සූත්‍රය
3) රතන සූත්‍රය 4) කරණීය මෙත්ත සූත්‍රය

34) පහත සඳහන් කරුණු අතරින් කාලාම සූත්‍රයේ එන යමක් නොපිළිගැනීමට හේතුවන කරුණක් වන්නේ

1) පාපයෙහි නොඇලීම 2) උත්සාහයෙන් තොරවීම
3) ධනය හුදකලාව භුක්ති විඳීම 4) න්‍යායට අනුකූල වීම

35) වෙනත් සතුන් අතර ජීව විද්‍යාත්මක වෙනස්කම් පැවතිය ද මිනිසුන් අතර එවැනි වෙනස්කම් දැකිය නොහැකි බවත් ලිංග, ජාති වශයෙන් සමානාත්වයක් ඇති බවත් පෙන්වා දෙන සූත්‍රය වන්නේ

1) වාසෙට්ඨ සූත්‍රය
2) අම්බට්ඨ සූත්‍රය
3) කාලාම සූත්‍රය
4) පරාභව සූත්‍රය

36) චුල්ලකම්ම විභංග සූත්‍රයට අදාළව අන් සැපතට ඊර්ෂ්‍යා කරන්නා

1) විරූපීව උපදියි
2) අල්පේශාක්‍යව උපදියි
3) අල්පභෝගීව උපදියි
4) දුර්වර්ණව උපදියි

37) සසර දුක නැති කිරීම හෙවත් පටිලෝම පටිච්ච සමුප්පාද මූලධර්මයට අනුව නාමරූප හෙවත් පංචස්කන්ධය පහළ නොවීමෙන් නැතිව යන්නේ

1) විඤ්ඤාණයයි
2) ඵස්සයයි
3) සළායතනයයි
4) වේදනාවයි

38) බුදුදහමේ ඉතාම වැදගත් ඉගැන්වීමක් ලෙස චතුරාර්ය සත්‍යය හැඳින්විය හැකිය. එහි එන දෙවන ආර්ය සත්‍ය වනුයේ,

1) දුක්ඛ සත්‍යය
2) දුක්ඛ සමුදය ආර්ය සත්‍යය
3) දක්ඛ නිරෝද ආර්ය සත්‍යය
4) දුක්ඛ නිරෝධ ගාමිණී පටිපද ආර්ය සත්‍යය

39) අප අවට පරිසරය සුරක්ෂිත කළ යුතු බව බුදු දහමින් අවධාරණය කෙරේ. පසු සේදී යාම, ජල උල්පත් සිඳී යාම නාය යෑම වැනි ස්වභාවික විපත් ඇතිවීමට හේතු වන්නේ

1) වනාන්තර විනාශ කිරීම
2) වාතය දූෂණය වීම
3) ජලය අපිරිසිදු කිරීම
4) වැව් තැනීම

40) කුසගින්න ලොව පවතින බලවත්ම රෝගය ලෙස සලකන බුදුදහම සුදුසු ආහාර සුදුසු වේලාවට අවශ්‍ය ප්‍රමාණයට අනුභව කිරීම නිසා යහපත් ප්‍රතිඵල අත්වන බව ප්‍රකාශ කෙරෙන සූත්‍ර දේශනාව වනුයේ

1) අග්නි වච්ච ගොත්ත සූත්‍රය
2) වාසෙට්ඨ සූත්‍රය
3) මහා නිදන සූත්‍රය
4) භද්දාලි සූත්‍රය